# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

THE WORLD BANK

# ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP)

ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තුදීමේ ව්‍යාපෘතිය (IRDCRP) යනු ශ්‍රී ලංකා රජය (GOSL) සහ ලෝක බැංකුව (WB) විසින් එක්ව අරමුදල් සපයනු ලබන, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 103කි. එය සැලසුම් කර ඇත්තේ ගොවිපොළේ සිට පාරිභෝගිකයා දක්වා වූ වටිනාකම් දමයේ හඳුනාගත් අඩුපාඩු සපුරාලීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර හා වැවිලි යන උප අංශවල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සහය වීම පිණිසයි. මෙම වසර 05 ක ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ව්‍යාපෘති ප්‍රදේශයන්හි කෘෂි ආහාර නිෂ්පාදකයින්ගේ ඵලදායිතාව, තරඟකාරීත්වය සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමයි.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සඳහා පහත සඳහන් තනතුරු කොන්ත්‍රාත් පදනම මත (අංක 01 සිට 17 දක්වා) පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. එක් එක් තනතුර සඳහා වූ වැටුප 2019 මාර්තු 05 වන දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2019 මත පදනම් වේ.

| අංකය | වැටුප් කාණ්ඩ මට්ටම | තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | PS 2 | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - PMU | 01 |
| 02 | PS 2 | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - PMU (සංරචකය - 1) | 01 |
| 03 | PS 3 | ව්‍යාපාර සංවර්ධන සහ අලෙවිකරණ විශේෂඥ | 01 |
| 04 | PS 3 | ආයතනික සංවර්ධන සහ ධාරිතා සංවර්ධන විශේෂඥ | 01 |
| 05 | PS 3 | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) | 01 |
| 06 | PS 3 | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති ඉංජිනේරු (වාරිමාර්ග) | 01 |
| 07 | PS 3 | ජල කළමනාකරණ විශේෂඥ | 01 |
| 08 | PS 3 | කාලගුණික සුහුරු කෘෂිකර්ම විශේෂඥ | 01 |
| 09 | PS 3 | ICT/IEC විශේෂඥ | 01 |
| 10 | PS 4 | ගණකාධිකාරී | 01 |
| 11 | PS 4 | අභ්‍යන්තර විගණක | 01 |
| 12 | PS 5 | ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන නිලධාරී | 01 |
| 13 | PS 6 | ව්‍යාපෘති නිලධාරී (තරුණ සහ කාන්තා) | 01 |
| 14 | PS 6 | ව්‍යාපෘති නිලධාරී (ආයතනික සංවර්ධන සහ ධාරිතා සංවර්ධන) | 01 |
| 15 | PS 6 | ව්‍යාපෘති නිලධාරී (සංරචකය - 3) | 01 |
| 16 | PS 6 | ඉංජිනේරු සහකාර | 01 |
| 17 | PS 6 | ව්‍යාපෘති ලේකම් | 01 |

**මූලික සුදුසුකම් හා පළපුරුද්ද**

මූලික සුදුසුකම් සහ පළපුරුද්ද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2019 හි සඳහන් අවශ්‍යතා සමග අනුකූල විය යුතුය.

**පොදු කොන්දේසි :**

- වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 62 ට අඩුවිය යුතුය.
- ශ්‍රී ලංකාව තුළ විදේශ ආධාර ලබන ව්‍යාපෘතියක සමාන හෝ ඊට ඉහළ තනතුරක සේවා පළපුරුද්දක් තිබීම වඩාත් යෝග්‍ය වේ.
- අවශ්‍යතාව අනුව ක්ෂේත්‍ර කටයුතු සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක ස්ථාන වෙත ගමන් කළ යුතුය.
- ඉංග්‍රීසි භාෂාව, පරිගණක සාක්ෂරතාවය පිළිබඳ ප්‍රවීණත්වය සහ රාජ්‍ය රීති සහ රෙගුලාසි පිළිබඳ පුරුද්ද අවශ්‍ය වේ.
- අදාළ ක්ෂේත්‍රයන් හි වෘත්තීය සුදුසුකම් තිබීම අමතර වාසියකි.
- සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර, ඉහත බඳවා ගැනීම් සම්බන්ධයෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන හා තීරණාත්මක වේ.
- ඕනෑම ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වන අතර එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අයදුම්පත් :**

සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත්, ආවරණ ලිපියක්, ජීවදත්ත තොරතුරු සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ තොරතුරු හා සහතික පිටපත් සමග, 2025 නොවැම්බර් 09 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මඟින් එවිය යුතු අතර අවසාන දිනට පෙර තම අයදුම්පත් **pmuirdcrp@gmail.com** විද්‍යුත් ලිපිනය වෙත එවිය යුතුය. තවද අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට පෙර **https://forms.gle/88XF2MKp8dXcocg18** සබැඳිය ඔස්සේ ගූගල් පත්‍රිකාව පිරවිය යුතුය. අයදුම්කරනු ලබන තනතුර අයදුම්පතෙහි සහ අයදුම්පත් බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළයුතුය. දැනටර ාජ්‍ය / අර්ධ රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය,**
**අංක : 123/2, පන්නිපිටිය පාර,**
**බත්තරමුල්ල.**

වැඩිදුර තොරතුරු සඳහා (රැකියා විස්තර / යොමු අනුදේශ, මූලික සුදුසුකම් ආදිය) කරුණාකර වෙබ් අඩවිය (**https://www.agrimin.gov.lk**) වෙත පිවිසෙන්න.

**ලේකම්,**
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.**